## කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

### භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ අපහරණය කිරීම සඳහා මිල ගණන් කැඳවීමයි

### <u>ටෙන්ඩර්කරුවන්ට උපදෙස් හා කොන්දේසි</u>

අංක 73/1, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයෙහි පිහිටි කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙන් ඉවත් කරන ලද භාණ්ඩ අපහරණය කිරීමට නියමිතව ඇති අතර ඒ සඳහා 2025.09.30 දින සිට මිල ගණන් කැඳවනු ලැබේ.

01. අපරහණය කිරීමට නියමිත මෙම අයිතමයන් 2025.09.30 දින සිට 2025.10.16 දින දක්වා කාර්යාලීය දිනයන්හීදී පෙ. ව. 09.00 සිට ප. ව. 03.00 දක්වා ඉහත ලිපිනයේදී පරීක්ෂා කර බැලිය හැකිය. මේ සඳහා ඕනෑම අයෙකුට මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ හැකිය. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත, කාර්යාලීය නිල හැඳුනුම්පත හෝ තහවුරු කළ හැකි වෙනත් ලේඛන ඉදිරිපත් කළ හැකිය.

02. අපහරණය කිරීමට නියමිත අයිතම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේදී අදාළ අයිතමයේ සම්පූර්ණ තොගය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ හැකි අතර එහිදී එක් එක් අයිතමයට අදාළ තොගය සඳහා වැඩිම මිලක් ඉදිරිපත් කර ඇති ගැනුම්කරුට ප්‍රමුඛතාවය ලබා දී අදාල භාණ්ඩ විකිණීම සිදු කරනු ලබයි.

03. අයදුම්කරුවන් විසින් 2025.09.30 දින සිට 2025.10.16 දින දක්වා කාර්යාලයීය දිනයන්හි පෙ. ව. 09.00ත් ප. ව. 03.00ත් අතර කාලය තුලදී ගණකාධිකාරී වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ආපසු නොගෙවනු ලබන රු. 500.00ක මුදලක් ගෙවීම් කිරීමෙන් අදාල ටෙන්ඩර් ලේඛන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයෙන් ලබා ගත හැකිය. එක් අයෙකුට සියළුම අයිතමයන් සඳහා ද එක් අයදුම්පතක් ලබා ගෙන මිල ගණන් ඉදිරිපත් කළ හැකිය.

04. පහත අයදුම් ආකෘති යොදා ගෙන මිල ගණන් ඉදිරිපත් කළ යුතු වේ.

ආකෘති පත්‍ර - I

පරිගණක උපාංග හැර අනෙකුත් කාර්යාලීය උපකරණ මිල දී ගැනීමට අපේක්ෂා කරනු ලබන අයදුම්කරුවන්

ආකෘති පත්‍ර - II

පරිගණක උපාංග, ඡායා පිටපත් යන්ත්‍ර, ස්කෑනර් හා වායු සමීකරණ යන්ත්‍ර ආදිය මිලදී ගැනීමට අපේක්ෂා කරනු ලබන අයදුම්කරුවන්

ආකෘති පත්‍ර - III

ගොඩනැගිලි අබලි ද්‍රව්‍ය මිලදී ගැනීමට අපේක්ෂා කරනු ලබන අයදුම්කරුවන්

ඉහත ආකෘති පත්‍ර එක් අයදුම්පත්‍රයක් මිලදී ගැනීමෙන් ලබා ගත හැකි වන අතර ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් ලබා ගැනීමට අවශ්‍ය නොවේ. නමුත් එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් එක් බාණ්ඩයකින් (ආකෘති පත්‍ර - I, II සහ IIIන්) එක් අයදුම්පතක් පමණි.

05. අයදුම්පත්‍රයෙහි ලංසු මිල ගණන් පැහැදිලි අත් අකුරෙන් සඳහන් කළ යුතු වේ. සම්පූර්ණ කර මුද්‍රා තබන ලද මිල ගණන් **ලේකම්, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, අංක 73/1, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයට** ලැබෙන පරිදි ලිපි කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරෙහි **" භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ අපහරණය කිරීම සඳහා මිල ගණන් කැඳවීම"** යනුවෙන් සඳහන් කර **2025.10.17 දින ප. ව. 02.00**ට පෙර හෝ ඊට ප්‍රථම අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය. එම වේලාවට පසුව ඉදිරිපත් කරනු ලබන ලංසු ලේඛන ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ලංසු ලේඛන විවෘත කිරීම 2025.10.17 දින ප. ව. 02.00ට අමාත්‍යාංශ ශ්‍රවනාගාරයේදී සිදු කරනු ලබන අතර, අදාල අවස්ථාවට ලංසුකරුට සහභාගී විය හැකිය.

07. තෝරාගත් ලංසුකරු වෙත ඒ බව ලිඛිතව දැනුම්දෙනු ලබන අතර, එම ලිපියෙහි සඳහන් දින සිට සතියේ වැඩ කරන දින 07ක් ඇතුලත අදාල භාණ්ඩ තොගය මිලදී ගැනීම වෙනුවෙන් එම ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද මිල අනුව මුළු මුදල අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවීම් කර, ඊට අදාල ලදුපත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මුළු භාණ්ඩ තොගය කඩිනමින් ඉවත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

08. මේ සම්බන්ධව වැඩිදුර විස්තර සඳහා ප්‍රසම්පාදන අංශයේ ඇති උපදෙස් පත්‍රිකාවෙන් හෝ ගණකාධිකාරී මඟින් 0112327053 (දිගුව - 320) හෝ ප්‍රසම්පාදන අංශය 0112347392 (දිගු 266, 309) ඇමතීමෙන් ලබා ගත හැකිය.

09. භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ විකිණීම පිළිබඳ අවසන් තීරණය අමාත්‍යාංශ ලේකම් සතු වේ.

මෙම මිල ඉදිරිපත් කරන අවස්ථාවේදී ටෙන්ඩරයට අදාලව ඉහතින් සඳහන් කර ඇති උපදෙස් හා කොන්දේසි පිළිගෙන මෙම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කරන බවට මෙයින් සහතික කරමි. තවද, අදාළ මිල ගණන් පිළිගනු ලැබුවහොත් ඉහත වගන්ති 7හි සඳහන් කර ඇති පරිදි අදාල භාණ්ඩ තොගය සඳහා මුදල් ගෙවා, සතියේ වැඩ කරන දින 07ක් ඇතුලත භාණ්ඩ ඉවත් කර ගැනීමට එකඟවෙමි.

දිනය : ...............................

අයදුම්කරුගේ නම : ...............................................

අයදුම්කරුගේ අත්සන : ...............................................

ජාතික හැඳුනුම්පත් අංකය : ...............................................